**UNIVERSITY OF PERADENIYA**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**
**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL- OLD SYLLABUS) – DECEMBER 2019
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර - පැරණි නිර්දේශය) - 2019 දෙසැම්බර්

BUDDHIST PHILOSOPHY - II / බෞද්ධ දර්ශනය- II - (BPG - 2)
**(බෞද්ධ දර්ශන ඉතිහාසය, තුලනය හා භාවිතය)**

ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි. (කාලය : **පැය තුනයි**)

---

1. බෞද්ධ දර්ශනය මගින් හඳුන්වා දුන් නව චින්තනයෙහි විශේෂතා සමකාලීන ආගමික ඉගැන්වීම් සැලකිල්ලට ගනිමින් සාකච්ඡා කරන්න.

2. සමකාලීන ශ්‍රමණ සම්ප්‍රදායන්ට අයත් ඉගැන්වීම් අතර බුදු දහම ස්වච්ඡන්දයට ප්‍රමුඛතාව දීමේ හේතු විමර්ශනය කරන්න.

3. 'සියල්ල සිදුවන්නේ පෙර කර්මය නිසාය' යන මතය බුදුදහම ප්‍රතික්ෂප කරන්නේ කවර හේතු නිසාදැයි සාකච්ඡා කරන්න.

4. ''සමාජ සංස්ථාවන්හි ප්‍රභවය ඊශ්වර නිර්මාණවාදයක් අනුව සිදු නොවන අතර එය ප්‍රතීත්‍යසමුත්පාද න්‍යායට අනුව සිදු වූ බව බෞද්ධ ඉගැන්වීමයි.'' විමර්ශනය කරන්න.

5. මනස පිළිබඳ බෞද්ධ දාර්ශනික විග්‍රහයන්හි දක්නට ලැබෙන මනෝවිද්‍යාත්මක පසුබිම බටහිර මනෝවිද්‍යාත්මක ඉගැන්වීම්වලින් වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න.

6. බෞද්ධ දර්ශන සම්ප්‍රදයන්ට අයත් දාර්ශනික ඉගැන්වීම් සඳහා බෞද්ධ මූලධර්ම පාදක වූ ආකාරය සාකච්ඡා කරන්න.

අනෙක් පිටුවට ...

7. යෝගාචාර සම්ප්‍රදයෙහි මූලික ඉගැන්වීම් පරීක්ෂාකොට ඒ සඳහා මුල් බුදු සමයාගත දාර්ශනික ඉගැන්වීම් පදනම් වූ ආකාරය පෙන්වා දෙන්න.

8. ශූන්‍යතාව ප්‍රතීත්‍යසමුත්පාදය වශයෙන් ආචාර්ය නාගාර්ජුන පාදයන් පැහැදිලි කරන ආකාරය මාධ්‍යමික සම්ප්‍රදය ඇසුරෙන් පැහැදිලි කරන්න.

9. ''මහායාන දර්ශන සම්ප්‍රදායන් විසින් බෞද්ධ දාර්ශනික ඉගැන්වීම් හඳුන්වා දීම සමකාලීන මතවාදයන්ට දක්වූ විචාරපූර්වක ප්‍රතිචාරයන්හි ඵලයකි.'' විචාරාත්මකව පිරික්සන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් <u>හතරකට</u> කෙටි සටහන් ලියන්න.

I. ක්ෂණවාදය
II. ආලය විඥනය
III. භවංග සංකල්පය
IV. ත්‍රිකාය සිද්ධාන්තය
V. පරමාර්ථසත්‍යය
VI. බෝධිසත්ව සංකල්පය

=========